ඇමුණුම 01

# වැඩිහිටි සත්කාරක සේවය උපදෙස් මාලාව -2025

**හැඳින්වීම :-**

සීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනයේ අභියෝගයට අද මුළුමහත් ලෝකයම මුහුණ දී සිටින අතර, ශ්‍රී ලංකාවද දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල් අභිබවා සීඝ්‍රයෙන් ජනගහනය වියපත් වීමේ ක්‍රියාවලියට අවතීර්ණ වෙමින් පවතින අතර, අනෙක් අතින් සමාජය සංකීර්ණ වීමේ හා විස්තෘත පවුල බිඳවැටීමේ ප්‍රතිඵලයක් ලෙස වැඩිහිටියන්ට ඥාතී රැකවරණය අහිමි වීමෙන් ඔවුන්ට වැඩිහිටි නිවාස ගතවීමට සිදුවේ.

මෙම වැඩිහිටි නිවාසවල නේවාසික ප්‍රජාව රැක බලා ගැනීම සහ ඔවුන්ගේ කායික, සමාජීය හා මානසික අවශ්‍යතා තෘප්ත කරමින් වඩා හොඳ සහ යහපත් ජීවන තත්වයක් ළඟා කර දීම සඳහා මෙම වැඩිහිටි නිවාසවල සත්කාරක සේවා සපයන සියලු නිලධාරීන්ට වැඩිහිටියා හා වැඩිහිටි භාවය පිළිබඳවත් වැඩිහිටි සත්කාරක සේවය පිළිබඳවත් මනා පුහුණුවක් ලබාදිය යුතුව ඇත.

- **අරමුණු :-**

  වැඩිහිටි නිවාසවල නේවාසික වැඩිහිටියන්ගේ රැකවරණය සලසන ආසන්නතම කණ්ඩායම වශයෙන් වැඩිහිටි නිවාසවල සේවය සත්කාරක සේවා සපයන සියලු නිලධාරීන්ට දැනුවත් කිරීම මඟින් ඔවුන් ගෙන් වඩා යහපත් ප්‍රමාණාත්මක හා ගුණාත්මක සේවාවක් ලබා ගැනීම තුළින් නේවාසික වැඩිහිටි ප්‍රජාවගේ රැකවරණය සැලසීම.

- **වැඩසටහන් ක්‍රියාත්මක කිරීම :-**

❖ දිස්ත්‍රික්කය තුළ පිහිටි වැඩිහිටි නිවාස වල සේවය කරන පාලක, පාලිකාවන් හා දිස්ත්‍රිකයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වැඩිහිටි විෂය ආවරණය කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් මේ සඳහා සහභාගි කර ගත යුතුය.

❖ වැඩසටහන සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ඉල්ලීම් ලිපිය සමඟ උපරිමය රු. 250,000.00 යටත්ව ඇස්තමේන්තුවක් ඉදිරි පත් කළ යුතුය

❖ වැඩසටහන පැවැත්විය යුතු අවම කාලය දින 03 ක පුහුණු කාලයක් විය විය යුතුය.

❖ වැඩසටහනේ අන්තර්ගතය පහත පරිදි විය යුතුය.

<u>පළමු දිනය</u>

- Introduction to Aged care services – වයස්ගත සත්කාර සේවා හඳුන්වාදීම
- Human developmental stages and the process of ageing - මානව සංවර්ධන අවධීන් සහ වයසට යාම ක්‍රියාවලිය
- Introduction to common health and other issues of elders - වැඩිහිටියන්ගේ පොදු සෞඛ්‍ය සහ අනෙකුත් ගැටළු පිළිබඳ හැඳින්වීමක්
- guidance to elder care provider - වැඩිහිටි සත්කාර සපයන්නා වෙත මග පෙන්වීම
  - Code of ethics - ආචාර ධර්ම පද්ධතිය
  - Code of conduct - හැසිරීම් සංග්‍රහය
  - Attitude, life skills, ethics and responsibilities - ආකල්ප, ජීවන කුසලතා, ආචාර ධර්ම සහ වගකීම්

- Introduction to Physical Support and Basic Nursing Skills - ශාරීරික සහාය සහ මූලික හෙද කුසලතා පිළිබඳ හැඳින්වීම
- First Aid and Basic Life Support and End of Life care - ප්‍රථමාධාර සහ මූලික ජීවිත සහය සහ ජීවිතාන්තය දක්වා රැකවරණය
- Nutrition and Exercises towards active ageing - ක්‍රියාශීලී වයසට යාම සඳහා පෝෂණය සහ ව්‍යායාම
- Psychological Support and Spiritual Wellbeing to elders - වැඩිහිටියන්ට මානසික සහයෝගය සහ අධ්‍යාත්මික යහපැවැත්ම
- Elders abuse - වැඩිහිටියන් අපයෝජනය කිරීම

<u>දෙවන දිනය</u>

- Common health issues of older adults - වැඩිහිටියන්ගේ පොදු සෞඛ්‍ය ගැටළු
- Nursing for bedbound older adult - ඇඳට සීමා වූ වැඩිහිටියන් සඳහා සාත්තු කිරීම
- Management of bedsore - ඇඳ ඇතිරිලි කළමනාකරණය
- Skills developed in counselling old adults and relatives - මහලු වැඩිහිටියන්ට සහ ඥාතීන්ට උපදේශනය කිරීමේ කුසලතා වර්ධනය වීම.
- Taking care of elderly with cognitive impairment - සංජානන දුර්වලතා ඇති වැඩිහිටියන් රැකබලා ගැනීම
- Converting disabled to able older adult - ආබාධිතයන් ශක්තිමත් වැඩිහිටි පුද්ගලයින් බවට පරිවර්තනය කිරීම

<u>තෙවන දිනය</u>

- Management of an Elders Home - වැඩිහිටි නිවාසයක කළමනාකරණය
- Maintaining accounts of an Elders Home- වැඩිහිටි නිවාසයක ගිණුම් පවත්වාගෙන යාම
- Visit to elders home and awarding certificate -වැඩිහිටි නිවාසයට ගොස් සහතික පත්‍ර ප්‍රදානය කිරීම

- සම්පත් දායකයින් ලෙස උක්ත නිර්ණායක සඳහා දැනුම ඇති සුදුසු නිලධාරින් තෝරාගත යුතුයි.

- උක්ත මාතෘකා සඳහා මෙම වැඩසටහන සඳහා සම්පත් දායකයින් තෝරා ගැනීමේදී හා දීමනා ගෙවීමේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛන අංක 07/2025 හා 2025.03.17 අනුව කටයුතු සිදු කළ යුතුය.

❖ මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරී (වැඩිහිටි) / සමාජ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී ( සමාජ සේවා) විසින් සිදු කළ යුතු වේ.

❖ වැඩසටහනසඳහා මුදල් ප්‍රතිපාදන යොමු කර මාස තුනක් ඇතුළත හෝ 2025.11.30 වන දින යන දින දෙකෙන් පළමු එළඹෙන දිනට ප්‍රථම පවත්වා අවසන් කළ යුතුය.

අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම

- මුදල් ලැබීම් කුවිතාන්සි පත (පොදු 172) මුදල් ලැබී දින 14 ක් ඇතුළත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

- වැඩසටහන පවත්වා අවසන් වූ වහාම ඒ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිත සවිස්තර වාර්තාව NSE/DEV/FO/ 004/I (ඇමුණුම් 03 හා 04) ආකෘතියට අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇමුණුම 02

# වැඩිහිටි සත්කාරක සේවා පුහුණු වැඩසටහන

# ඉල්ලීම් ආකෘති පත්‍රය -2025

1. දිස්ත්‍රික්කය :- ..........................................................................................................
2. පැවැත්වීමට අපේක්ෂිත දිනය :- ..........................................................................................................
3. සහභාගීත්වය

| අනු අංකය | වැඩිහිටි නිවාසයේ නම | සහභාගි වන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

4.යොජිත දළ ඇස්තමේන්තුව

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු ගත මුදල (රු) |
|---|---|---|
| 01 | සම්පත්දායක දීමනා | |
| 02 | සංග්‍රහ වියදම් | |
| 03 | ගමන් වියදම් දීමනා | |
| 04 | වෙනත්<br>1.<br>2.<br>3 | |
| එකතුව | | |

සකස් කළේ :- .......................... නිර්දේශ කළේ :-......................... අනුමත කළේ :- ......................

විෂය භාර නිලධාරි සහකාර දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් ලේකම්

නිල මුද්‍රව පරිපාලන නිලධාරි නිල මුද්‍රව